# CENTRE FOR MONITORING ELECTION VIOLENCE
## මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
## தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

No 160G, Poorwarama Road, Kirulapone. **Tel:** +094-11 2826388/+094-11 2826384
**Fax**: +094-11 2826146 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org


මාධ්‍ය නිවේදනය - කොළඹ, ශ්‍රී ලංකා - 2019 ඔක්තෝබර් මස 12 දින 15.00 පැය

**ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම 2019.**

ගාල්ල දිස්ත්‍රික්කයේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වීමට නියමිත ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම පෙරදින එනම් වසර 2019 ඔක්තෝබර් මස 11 වැනි දින ඡන්ද මධ්‍යස්ථාන 47 ක් කේන්ද්‍ර කරගනිමින් පැවැත්විණ. පිළිගත් දේශපාලන පක්ෂ පහක් (05) මගින් ඉදිරිපත් කොට ඇති අපේක්ෂක අපේක්ෂිකාවන් 155 ක ප්‍රමාණයක් මෙම ප්‍රාදේශීය සභා ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූහ.

සුදුසුකම් ලත් 53,384 ක් වන ලියාපදිංචි ඡන්දදායකයන් පිරිසක්, ප්‍රාදේශීය සභා සභිකයන් 28 දෙනෙක් තෝරා ගැනීම සඳහා තම ඡන්දය භාවිත කිරීමට නියමිතව තිබූ අතර ඡන්ද විමසීම අවසන, ඡන්දය භාවිත කිරීමේ ප්‍රතිශතය 75% ක් පමණ විය.

මෙම ඡන්ද විමසීමේ විශේෂත්වය වන්නේ පසුගිය වසරේ එනම් වසර 2018 පෙබරවාරි මස 10 වැනි දින පැවති පළාත් පාලන ඡන්ද විමසීමට සමගාමීව පැවැත්වීමට නොහැකි ව, 12/2018 දරණ ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ප්‍රකාරව මෙම ඡන්ද විමසීම පැවැත්වීමයි. ඒ මෙවර තරග කරනු ලබන එක් දේශපාලන පක්ෂයක් මගින් ඉදිරිපත් කරන ලද නාම යෝජනා පත්‍රය ගාල්ල දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙනි.

පූර්ව මැතිවරණ කාල සමය ඉතා සාමකාමී ස්වරූපයක් ගත් මෙම ඡන්ද විමසීමේ, මැතිවරණය පැවති දිනයේ ද අවසන් ප්‍රතිඵලයට කිසිදු අහිතකර බලපෑමක් ඇති නොවන ආකාරයේ යම් බරපතල සිද්ධියක් වාර්තා වීමකින් තොරව නිමාවට පත් වුණි. එහෙත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම.) හා අනුයුක්ත නිරීක්ෂකයන් වාර්තා කල පරිදි පහත සඳහන් සිද්ධීන් කිහිපය ද සිදු නොවීමට අදාළ දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන් වගබලා ගත්තේනම් එය සුපිළිපන්න මැතිවරණ ක්‍රියාවලියක් අපේක්ෂා කරන පුරවැසියන්ගේ ඇගයීමට ලක්වන කරුණක් වනවා නිරනුමානය.

ගාල්ල, ඕමත්ත කනිෂ්ඨ විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය (02 අ): මෙම ඡන්ද මධ්‍යස්ථානය කරා වැටී ඇති මාර්ගය දෙපස පෝස්ටර් හා අනෙකුත් පත්‍රිකා අලවා තිබූ අතර මැතිවරණය පැවති දිනය පුරාම ඒවා එලෙසම ප්‍රදර්ශනය විය. එලෙස පෝස්ටර් ප්‍රදර්ශනය කර තිබුණේ එක්සත් ජාතික පක්ෂය, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යන පක්ෂ යටතේ තරග කරන ලද අපේක්ෂකයන් කිහිප දෙනෙක් විසිනි.

ගාල්ල, තලගස්පේ කනිෂ්ඨ විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය (05 ආ): මෙම ඡන්ද මධ්‍යස්ථානය අසල රැඳෙමින් ඡන්දදායකයන් හට ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ වෙත ඡන්දය භාවිත කරන ලෙස ඉල්ලා සිටි කාන්තාවක් පිලිබඳව මැ.ප්‍ර.නි.ම. වෙත වාර්තා විය. එහිදී ඇය ඉහත සඳහන් දේශපාලන පක්ෂය යටතේ තරඟ වැදුණු අපේක්ෂක මල්ලියාවඩු නලින් චමින්ද ප්‍රියදර්ශන වෙත තම ඡන්දය ලබා දෙන ලෙස ඉල්ලා සිට ඇත.

ගා/ඇල්පිටිය ආනන්ද මධ්‍ය මහා විද්‍යාලය ඡන්ද මධ්‍යස්ථානය (11 ඇ): මෙකී ඡන්ද මධ්‍යස්ථානය ඇතුලු තවත් ඡන්ද මධ්‍යස්ථාන කිහිපයක් වෙත එක්සත් ජාතික පක්ෂ අපේක්ෂකයන්ගේ රුව රැගත් පෝස්ටර් ප්‍රදර්ශනය කරමින් වාහන කිහිපයකින් සමන්විත රථ පෙළපාලියකින් ගමන්ගත් පාර්ලිමේන්තු මන්ත්‍රී පාලිත තෙවරප්පෙරුම ඇතුලු ප්‍රාදේශීය සභා ඡන්ද අපේක්ෂකයන් පිරිසක් පිළිබඳව මැ.ප්‍ර.නි.ම.යේ නිරීක්ෂකයන් කරුණු වාර්තා කර ඇත. එලෙස රථ පෙළපාලියක් සේ (ලියාපදිංචි අංක KR 6312, CAW 6990, GZ 2665,

WP 21-483 දරණ අංක තහඩු සහිත වාහන) තැනින් තැනට ගමන් කිරීම ඡන්ද මධ්‍යස්ථාන අවට පරිසරය තුළ නිතැතින්ම පැවතිය යුතු නිදහස් වාතාවරණය අභියෝගයට ලක් කිරීමක් විය.

ගා/ පිණිකහන සිරිනිවාස කනිෂ්ඨ විද්‍යාල ඡන්ද මධ්‍යස්ථානය (16 අ): ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ අපේක්ෂක ජයනෙත්තිආරච්චි ජනක කුමාර (අතිරේක ලැයිස්තුව යටතේ නම් කොට තිබූ අපේක්ෂකයෙකි) ඡන්ද මධ්‍යස්ථානය අසළ රැඳෙමින් තමන්ගේ දේශපාලන පක්ෂය වෙත ඡන්දය ලබා දෙන ලෙස ආයාචනා කර ඇත. ඒ ලියාපදිංචි අංක PG - 0007 දරණ අංක තහඩුව සහිත ඩිෆෙන්ඩර් වර්ගයේ රථය ද උපයෝගී කර ගනිමිනි.

එක් බලප්‍රදේශයකට සීමාව පැවතීම හා ජාතික මට්ටමේ තවත් මැතිවරණයක් අභියස සිටින පසුබිමක වඩාත් විවාදාත්මක පරිසරයක් තුළ පැවති ඡන්ද විමසීමක් වුවද, ඉතා ප්‍රශස්ත මට්ටමේ පූර්ව මැතිවරණ ප්‍රචාරක කාල සමයක් තුළ, මැතිවරණයක නිරායාසයෙන්ම පැවතිය යුතු සුපිළිපන්න බව ආරක්ෂා කරගැනීමට අදාළ පාර්ශව ගන්නා ලද උත්සහය මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ඇගයීමට ලක්වේ. තවද දේශපාලන පක්ෂ නායකයන් තම ආධාරකරුවන් නොපොළඹවන තාක් කල්, කවර මැතිවරණයක් වුව නිදහස් හා සාධාරණ පසුබිමක පැවැත්විය හැකිය යන අදහස ද මෙම ඡන්ද විමසීමත් සමඟ වඩාත් තහවුරු වූ බව අවධාරණය කල යුතුව ඇත.

එහෙත් මෙම මැතිවරණයට සමගාමීව උගත යුතු පාඩමක්ද ඇත්තේය යන්න මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයේ අදහසයි. එනම් අධිකරණය ඉදිරියේ මෙකී ඡන්ද විමසීම පැවැත්වීමේ වලංගුතාවය ප්‍රශ්න කිරීමට ලක්වුවද, ඊට අදාළ තීන්දුව ප්‍රකාශයට පත්කිරීම සඳහා ගතවූ අසාමාන්‍ය කාලයයි. එයද ඇතුළත්ව මෙරටේ මැතිවරණ ක්‍රියාවලිය තුළ මෑත කාලීනව විද්‍යමාන යම් යම් සිදුවීම් පිලිබඳ සලකා බැලීමේදී තහවුරු වන්නේ "මැතිවරණ ආශ්‍රිත ගැටලු" කඩිනමින් විසඳා ගැනීම සඳහා සුවිශේෂී වශයෙන් ඊටම වෙන්වූ අධිකරණයක් වහා ස්ථාපිත කිරීම කාලීන අවශ්‍යතාවක් බවයි.

මංජුල ගජනායක,

ජාතික සම්බන්ධීකාරක